**IPRC/16/187**

# බුදුසමයෙහි උපැවිදි කිරීමේ නිර්ණායක පිළිබඳ විමසුමක්

පඤ්ඤාලෝක කුඹුගොඩරේ හිමි[1*], සෝබිත කාරාපික්කාඩ හිමි[1]

ක්‍රි.පූ. 06 වන ශතවර්ෂයේ බුදුරදුන් ධරමාන සමයෙහි භාරතීය ශාසන සම්ප්‍රදායන් ප්‍රධාන වශයෙන් දෙකක් දක්නට ලැබුණි. එනම්, බ්‍රාහ්මණ සම්ප්‍රදාය හා ශ්‍රමණ සම්ප්‍රදාය වශයෙනි. වෛදික යුගයේ සිට පරිණාමීයව ආ හින්දු ආගමෙහි කූඨප්‍රාප්තිය ක්‍රි.පූ. 06 වන ශතවර්ෂයේ සිදුව තිබුණි. බමුණු ආධිපත්‍ය යටතේ ගොඩනැගුණු එම බ්‍රාහ්මණ ආගමෙහි බමුණන් ගොඩනැගූ ශාසන සම්ප්‍රදාය බ්‍රාහ්මණ සම්ප්‍රදාය නම් විය. බ්‍රාහ්මණ සම්ප්‍රදාය සෘජු හෝ වක්‍ර වශයෙන් ප්‍රතික්ෂේප කර ඉන් පරිබාහිර සම්ප්‍රදයක් ගොඩනැගූ අචේලක පරිබ්‍රාජක යනාදී පිරිස් ශ්‍රමණ සම්ප්‍රදායට අයත් වේ. ශ්‍රමණ සම්ප්‍රදායෙහි මස්තකප්‍රාප්තිය ලෙස බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදාය හඳුන්වා දිය හැකිය. භික්ඛු යන ප්‍රමුඛ පදයෙන් හැඳින්වූ භික්ෂුව පැවිදි කිරීම හා උපැවිදි කිරිම සම්බන්ධයෙන් දක්නට ලැබෙන නිර්ණායක රාශියකි. මෙහි දී අපගේ විශේෂ අවධානය යොමු වන්නේ භික්ෂුවක් උපැවිදි කිරීම පිළිබඳ බෞද්ධ නිර්ණායක කවරේද යන්නයි. විශේෂයෙන් භික්ෂු විනය පිළිබඳ වඩාත් කතා බහට ලක්වන මෙවැනි යුගයක මේ පිළිබඳව අධ්‍යයනය කිරිම වඩාත් උචිත බව හැඟේ.

බෞද්ධ විනය ග්‍රන්ථයන්ට අනුව භික්ෂුවට හිමිවන ප්‍රධාන දඬුවම් තුනකි. 1) බ්‍රහ්ම දණ්ඩනය 2) පැවිදි සමාජයෙන් ඉවත් කිරිම 3) උපැවිදි කිරිම. මේ අනුව උපැවිදි කර පිටත්කර හැරීම සිදුකළ හැක්කේ සාමණේර භික්ෂුවක් සඳහා පමණි. විනය පිටකයෙහි මහාවග්ග පාලියෙහි දැක්වෙන ආකාරයට දුර්ගුණ දහයකින් යුත් සාමණේර සිවුරු හරවා පිටත් කළ හැකිය. ඒ සඳහා සෘජු ලෙසම උපාධ්‍යාය, ආචාර්ය යන දෙදෙනාට බලය තිබේ. නමුත් උපසම්පන්න භික්ෂුවක් සම්බන්ධයෙන් ගනු ලබන සෑම විනය ක්‍රියා මාර්ගයක්ම ප්‍රාතිමෝක්ෂ දේශනයන්ට අනුව සිදුකෙරේ. එය ඉතාම වගකීම් සහගත ක්‍රියාවලියකි. අපගේ පර්යේෂණයට අනුව විශේෂයෙන් සතර පාරිජිකාවන්ට පත් වූ භික්ෂුව පර්යේෂණ මණ්ඩලයක් මගින් පෝය සීමාවක පැවැත්වෙන පර්යේෂණය අවසානයේ උන්වහන්සේට අදාළ චෝදනා ඉදිරිපත් කර සංඝ සමාජයේ කටයුතුවලින් බැහැර කිරීම සිදුකළ හැකිය. විනය පිටකයෙහි මේ සඳහා “අසංවාසො” (සංවාසයට නුසුදුසු) යන පදය බහුලව භාවිතා කර ඇත. එමගින් කිසිවිටෙක සිවුරු ගලවා ඉවත් කිරිම අදහස් නොවුනද සම්බුද්ධ පරිණිර්වාණයෙන් පසුව රාජ්‍ය මැදිහත්වීම් සමග බොහෝ භික්ෂූන් උපැවිදි භාවයට පත්කර ඇති අයුරු පැහැදිලි වේ. නව භික්ෂු කතිකාවතෙහි ද (2015.12.11) උපැවිදි කිරිම යන්න දඬුවමක් ලෙස දක්වා නොමැත. ඒ අනුව විශේෂයෙන් අප මෙහි දී අවධානය යොමු කරනුයේ භික්ෂුවක් උපැවිදි කළ හැකිද ? ඒ කෙසේද ? ඒ සඳහා රාජ්‍ය මැදිහත්වීම බලපානු ලබන්නේ කෙසේද යන කරුණු පිළිබඳවයි.

***ප්‍රමුඛ පද:*** *පැවිද්ද" උපැවිද්ද" සාමණේර " උපසම්පදා" භික්ෂු විනය*

[1] භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය *kumbugoda@gmail.com